DMC
SRI LANKA

# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
# මිල ගණන් කැඳවීමයි

ප්‍රසම්පාදන අංකය - DMC/FIN/2024 (PROCU: 12)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ,අවමකිරීම්,පර්යේෂණ හා සංවර්ධන අධ්‍යක්ෂ සඳහා **“ආපදා අවදානම් අවමකිරිම, නාගරික සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහයට අන්තර්ග්‍රහණය කිරීමේ මාර්ගෝපදේශය”** මුද්‍රණය කිරීමට ඉදිරිපත් කර ඇති බැවින් එම ප්‍රසම්පාදනය සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙතින් මිල ගණන් කැඳවීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කර තිබේ.

ඒ අනුව උක්ත ප්‍රසම්පාදනය සම්බන්ධව ඔබ ආයතනය උනන්දුවක් දක්වන්නේ නම්, මේ සමග පහතින් දක්වා ඇති අයිතමයන්ට, ඔබ ආයතනයේ මුද්‍රා තැබූ මිල ගණන් 2024.12.24 වන දින ප.ව. 02.30 හෝ ඊට පෙර **“Mainstreaming to DRR to Urban Development”** යනුවෙන් ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර, **සභාපති - ප්‍රසම්පාදන කමිටුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ප්‍රසම්පාදන ඒකකය, මුදල් අංශය, 3 වන මහළ, විද්‍යා මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් හෝ 03 වන මහලේ, මුදල් අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටිය වෙත ගෙනවිත් බහාලන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

එසේම, ඔබ ආයතනයේ බලයලත් නිළධාරියෙකුගේ අත්සන හා ආයතනයේ නිළ මුද්‍රාව තබා මිල ගණන් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

ප්‍රසම්පාදන කමිටුව
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය,
විද්‍යා මාවත,
කොළඹ 07